# ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමය
# இலங்கை அரசாங்க சேவை வீளையாட்டுச சங்கம்
# Sri Lanka Government Service Sports Society
No. 2/12, 2/16, Polhengoda Road, Narahenpita, Colombo 05.
Tel & Fax : 011-2513012 Email : srilankagsss.2024@gmail.com


රාසේක්‍රීස/තරග/2026 2026.08.14

සියළුම අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් වෙත

<u>රාජ්‍ය සේවා සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලිය - 2026 (පිරිමි හා කාන්තා)</u>

රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන රාජ්‍ය සේවා ක්‍රිකට් තරඟාවලිය 2026 සැප්තැම්බර් මස පැවැත්වීමට රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමය අදහස් කර ඇත.

එම තරඟාවලිය සඳහා ඔබ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / ආයතන නියෝජනය කරමින් ක්‍රිකට් කණ්ඩායම් සහභාගි කරවන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

<u>තරඟ කොන්දේසි හා නීතිරීති</u>

1. මෙම තරඟාවලි සඳහා මධ්‍යම / පළාත් රාජ්‍ය සේවයේ නියුතු අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු හා ආයතන වල ස්ථිර සේවයේ නියුතු / විශ්‍රාම වැටුප් හිමිකම් සහිත කාර්ය මණ්ඩලයට සහභාගී විය හැක.

2. එක් අමාත්‍යාංශයකට / දෙපාර්තමේන්තුවකට / ආයතනයකට ඉදිරිපත් කළ හැක්කේ එක් කණ්ඩායමක් පමණි.

3. එක් කණ්ඩායමක් සඳහා ක්‍රීඩකයින් 15 ලියාපදිංචි කල හැකි අතර ඉන් තරඟයට සහභාගී විය හැක්කේ 11 දෙනෙකුට පමණි. තරඟයක් සඳහා අවම වශයෙන් ක්‍රීඩකයන් / ක්‍රීඩිකාවන් 9 දෙනෙකු සිටිය යුතුය.

4. පිළිමළුන් පිටු දැකීමේ ක්‍රමයට පැවැත්වෙන මෙම තරඟාවලියේ පිරිමි කණ්ඩායම් සඳහා එක් පිලකට පන්දු වාර 10 ක් වන අතර කාන්තා කණ්ඩායම් සඳහා පන්දුවාර 5 කි. පිරිමි කණ්ඩායම් සඳහා එක් පන්දු යවන්නෙකුට යැවිය හැකි උපරිම පන්දුවාර සංඛ්‍යාව 2 ක් වන අතර කාන්තා කණ්ඩායම් සඳහා එක් පන්දු යවන්නියකට යැවිය හැකි පන්දුවාර ගණන 1 කි.

5. යම් තරගයක් සම ලකුණු තත්වයකින් අවසන් වුවහොත් Super Over එකක් ලබා දෙන අතර පන්දු යැවීම සඳහා කැමැති පන්දු යවන්නෙකු භාවිතා කළ හැක. යම් හෙයකින් එයද සම මට්ටමින් අවසන් වුවහොත් කාසිය වාසිය මත ජය පැරදුම තීරණය වනු ඇත.

6. යම් තරඟයකදී අයහපත් කාලගුණ තත්වය මත විනිසුරුවන් විසින් තව දුරටත් ක්‍රීඩා කිරීම යෝග්‍ය නොවන බව තීරණය කළහොත් එම අවස්ථාව වන විට තරඟයේ දෙවන ඉනිමේ පන්දු වාර ප්‍රමාණයෙන් අඩකට වඩා ක්‍රීඩා කර ඇති අවස්ථාවකදී ලකුණු ලබා ගැනීමේ සාමාන්‍ය වේගය මත තරඟයේ ජයග්‍රහකයා තීරණය වනු ඇත. ජයග්‍රහකයා තෝරන අවස්ථාව වනවිට දෙවන ඉනිමේ පන්දුවාර ප්‍රමාණයෙන් අඩක් යොමු කර නොමැතිනම් එම තරගයේ ඉතිරි පන්දුවාර ප්‍රමාණය නව දිනක අවසන් කළ පන්දුවාරයේ සිට නැවත ක්‍රීඩා කිරීමට කටයුතු කරනු ඇත.

7. නිපන්දු (No Ball) සඳහා Free Hit අවස්ථාවක් ලබා දෙන අතර නිපන්දු සඳහා එක් ලකුණක්ද, වයිඩ් පන්දු (wide Ball) සඳහා එක් ලකුණක්ද, සමග අමතර පන්දුවක් හිමිවේ.

8. තරඟාවලියට සහභාගී වන කණ්ඩායම් වල සිටින ක්‍රීඩකයින් සම්බන්ධ යම් විරෝධතාවයක් ඇත්නම් එම තරඟය ආරම්භයට පෙර හෝ තරඟය අවසන් වී විනාඩි 15 කට ප්‍රථම ලිඛිතව සංවිධායක මණ්ඩලය වෙත රුපියල් 1000/= ක ගාස්තුවක් සමග ඉදිරිපත් කළ යුතුය. යම් හෙයකින් එම චෝදනාව ඔප්පු වුවහොත් අදාල මුදල ආපසු ගෙවනු ලැබේ.


**President**
**G.L. Sajith Jayalal**
Director,
National Institute of Sports Science,
#100/7, Independence Avenue,
Colombo - 07.
Mobile : 071 420 7008

**General Secretary**
**M. Judith Priyani Perera**
Library Information Officer,
National Institute of Sports Science,
#100/7, Independence Avenue,
Colombo - 07.
Mobile : 070 307 9421

**Treasurer**
**M.K.W.S. De Silva**
MSA Samsudeen Dev. (Pvt) Ltd,
#163, Union Place,
Colombo - 02.
Mobile : 071 22 33 888

9. තරඟාවලියට සහභාගි වන සියළුම ක්‍රීඩකයින් තම අනන්‍යතාවය තහවුරු වන පරිදි සුදුසු ඇඳුමකින් (T-shirt & Bottom) සැරසී තරඟයට සහභාගි විය යුතු අතර සපත්තු පැළඳීම අනිවාර්ය වේ. ( නිශ්චිත ක්‍රීඩා නිල ඇඳුමක් නොමැති කණ්ඩායම් සුදු ඇඳුමින් සැරසී ක්‍රීඩා කළ යුතුය.)

10. තරඟාවලියට සහභාගි වන සියළුම ක්‍රීඩක ක්‍රීඩිකාවන් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා තම ආයතනය විසින් නිකුත් කළ රාජකාරි හැඳුනුම්පත රැගෙන ආ යුතුය. එසේ නොවන ක්‍රීඩක / ක්‍රීඩිකාවන්හට තරඟාවලිය සඳහා සහභාගිවීමට අවස්ථාව නොලැබෙන අතර යම් ක්‍රීඩකයෙකුගේ / ක්‍රීඩිකාවකගේ කාර්යාල හැඳුනුම්පත අස්ථාන ගතවී ඇති අවස්ථාවකදී ක්‍රීඩකයාගේ / ක්‍රීඩිකාවගේ අත්සන සහිතව පොලිස් පැමිණිල්ලේ සහතික කල පිටපත් ඉදිරිපත් කළයුතුය.

11. තරඟාවලියට අවශ්‍ය සියළුම පන්දු සංවිධායක මණ්ඩලය විසින් සපයනු ලබන අතර එම පන්දුවලින් පමණක් ක්‍රීඩා කළ යුතුය.

12. තරඟාවලිය සඳහා ඇතුලත්වීමේ ගාස්තුව රුපියල් 5000/= ක් වන අතර එම මුදල හැටන් නැෂනල් බැංකුවේ අංක 104010002466 දරණ ගිණුමට බැර කිරීම හෝ රාජ්‍ය සේවා ක්‍රීඩා මූලස්ථානයට පැමිණ පස්වරු 3.30 ට පෙර මුදලින් ගෙවා අදාළ රිසිට් පතෙහි මුල් පිටපතක් අයදුම්පත්‍රය සමග ක්‍රිකට් ලේකම්, ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමය, 2/12 / 2/16, පොල්හේන්ගොඩ, කොළඹ - 05. යන ලිපිනයට 2026.08.31 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුය. (අදාළ අයදුම්පත්‍රය මේ සමග අමුණා ඇත.) තරඟ සටහන සකස් කිරීම 2025.08.31 දින පස්වරු 16.30 ට රාජ්‍ය සේවා ක්‍රීඩා සංගම් මූලස්ථානයේදී සිදුකරන අතර එක් ආයතනයක් නියෝජනය කරමින් එක් අයෙකුට මෙම අවස්ථාව සඳහා සහභාගිවීමේ අවස්ථාව ඇත.

13. අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර ඇතුලත්වීමේ ගාස්තු ගෙවිය යුතු අතර නියමිත පරිදි ඇතුලත්වීමේ ගාස්තු නොගෙවා ඇති කණ්ඩායම් තරඟ කාල සටහනින් ඉවත් කිරීමට සිදුවන බවද දන්වා සිටිමි.

14. තරඟයක විනිසුරුවරුන් ලබා දෙන තීරණය අවසන් තීරණය ලෙස සලකන අතර යම් හෙයකින් විනිසුරු තීරණයට අවනත නොවන කණ්ඩායම් තරඟාවලියෙන් ඉවත් කිරීමට සිදුවන බවද දන්වා සිටිමි.

15. මෙම තරඟාවලිය හුදෙක් රාජ්‍ය සේවයේ නියුතු කාර්ය මණ්ඩලයේ සුභදතාවය වර්ධන කර ගැනීමටත් ක්‍රීඩා දක්ෂතා ඇති රාජ්‍ය සේවකයින්ගේ දක්ෂතා ඇගයීමකට ලක් කරන අවස්ථාවක් බැවින් මෙම තරඟාවලිය සාර්ථක කර ගැනීමට සියළුම කණ්ඩායම් වල සහයෝගය අපේක්ෂා කරමි.

16. මෙම තරඟාවලිය සම්බන්ධ වැඩිදුර තොරතුරු ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රිකට් සංගමයේ ක්‍රිකට් ලේකම් පී.ජී. සමන් පීරිස් මහතාගෙන් (දු.අ. 0714203226) හා පරිපාලන ලේකම් රම්‍යනාත් රත්නායක මහතාගෙන්( 076 751 9151) ලබාගත හැක.

.........................................

එම්. ජුඩිත් ප්‍රියානි පෙරේරා

ප්‍රධාන ලේකම්

General Secretary
M. Judith Priyani Perera
Government Service
Sport Society